**නැගෙනහිර පළාත් සභාව - 2023 වර්ෂය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නැගෙනහිර පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2024 ජූලි 17 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය තළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 වැනි දින පාලක ජනරාල් කාර්යාලය විසින් නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ අංක 1.2.2 ඡේදයට අනුව 2019 වර්ෂයේ සිට රුපියල් මිලියන 51.74 ක කල්බදු වාහන සඳහා සමුච්චිත පොළිය වාර්ෂිකව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට හර කලයුතු වුවත් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය නොවන වත්කම්වලින් කල්බදු පොළිය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය නොවන වත්කම්වලින් කල්බදු පොළිය ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි සහ ව්‍යුහවල ඉදිකිරීම් කටයුතු සඳහා වැඩිපුර ගෙවූ රු. මිලියන 6.54 ක මුදල අයකරගෙන තිබුණද එය සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය | ශේෂ පිරික්සුමෙහි ශේෂවල ඒකාබද්ධ සාරාංශයට අනුව, එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන එන ලදී. | වත්කම් අත්පත් කර ගැනීමේ සැබෑ පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන වියදම්වලින් අඩුකර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත අධිකාරීන් 02 කින් උපයාගත් රු. මිලියන 38.87 ක විවිධ වර්ගවල ආදායම් පළාත් සභා අරමුදලේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මුළු ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ආදායම නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ඇ) | ව්‍යවස්ථාපිත අධිකාරීන් 02 ක රු. මිලියන 11.25 ක මුදල් සහ මුදල් හා සමාන දෑ සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සභා අරමුදලේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගෙන නොතිබුණි. එබැවින් එම වටිනාකමින් අරමුදලේ ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී පියවර ගනු ලැබේ. | මුදල් හා මුදල් සමාන ශේෂයන් මුල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුය. |
| (ඉ) | පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශයට ගෙවිය යුතු ලෙස දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 5.85 ක ශේෂය වගකීමක් ලෙස පෙන්වීම වෙනුවට පළාත් ආදායම් ගිණුමට මාරු කර තිබුණි. මේ අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. | මෙම වැරදි නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | තැන්පතු නිවැරදිව ගණනය කළ යුතුය. |
| (ඊ) | ආයතන 02 ක පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන (PSDG) වැඩ වෙනුවෙන් රු. මිලියන 5.75 ක බිල්පත් ගෙවීමට තිබුණද, එය පළාත් සභා අරමුදලේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයට ගෙන නොතිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අතැති බිල්පත් සහ කෙරීගෙන යන වැඩවල වටිනාකම වාර්තා කර ඇත. | වගකීම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභා 02 ක, අමාත්‍යාංශ 05 ක, ලේකම් කාර්යාල 09 ක සහ දෙපාර්තමේන්තු 18 ක රු. මිලියන 2.48 ක් වටිනා විවිධ ඉන්වෙන්ටරි අයිතම අපහරණය කර තිබුණද, එහි ඓතිහාසික පිරිවැය මූල්‍ය | ලබන වසරේ දී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | බැහැර කරන ලද භාණ්ඩවල වටිනාකම ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොවන වත්කම්වලින් ඉවත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඌ) | පළාතේ කොමිෂන් සභා 02 කට අමාත්‍යාංශ 05 කට ලේකම් කාර්යාල 09 කට සහ දෙපාර්තමේන්තු 18 කට අදාල රු. මිලියන 75.64 ක වගකීම් පළාත් සභා අරමුදලේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයට ගෙන නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | එම ආයතන විසින් තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගිණුම්ගත කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල වගකීම් නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරිත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය - 900 ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආණ්ඩුකාරවරයාට නිල වාහන 03 ක් භාවිත කිරීමට අවසර දී තිබුණද, නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් 2018 ඔක්තෝම්බර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයේ 3.1 ඡේදයට පටහැනිව ජනාධිපති ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව නිල වාහන 04 ක් භාවිත කර තිබුණි. | මෙම වාහන විශේෂ රැස්වීම්වලට සහභාගි වීම සඳහා භාවිත කර ඇත. | ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය මත පදනම්ව වාහන වෙන් කළ යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 01 සිට 2023 මැයි 21 දක්වා කාලය තුළ ආණ්ඩුකාරවරයාගේ විවිධ කාර්ය මණ්ඩලය විසින් භාවිතා කරන ලද නිල වාහන 06 ක් සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ 2018 ඔක්තෝබර් 12 දිනැති චක්‍රලේඛ අංක PS/CSA/11-18 හි 4.3 ඡේදයේ නියම කර ඇති සීමාවන් ඉක්මවා ඉන්ධන වියදම් රු.මිලියන 2.09 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. | මෙම වාහන ආරක්ෂාව, සංචිත අවශ්‍යතා ආදී අරමුණු සඳහා භාවිත කර ඇත. | ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය මත පදනම්ව ඉන්ධන වියදම් දැරීම කළ යුතුය. |

**1.5.2 ශීර්ෂය - 901 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | 2009 අංක 8 දරන මෝටර් රථ ප්‍රවාහන (සංශෝධන) පනතේ 203 පරිච්ඡේදයට පටහැනිව, 2022 දී මුතුර්හිදී අනතුර සිදු වූ වහාම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල සංචිත වාහනයක එන්ජිමක් ප්‍රතිස්ථාපනය කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත කටයුතු සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | එන්ජිම ගරාජයේ හිමිකරු විසින් ප්රතිස්ථාපනය කර ඇත. | එම මෝටර් රථ ප්රවාහන පනතට අනුව ක්රියාමාර්ග ගත යුතුයි. |

**1.5.3 ශීර්ෂය - 921 නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - මුදල්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතු කරන ලද මුළු ආදායමෙන් සියයට 47 ක් වූ රුපියල් මිලියන 1,581.45 ක විවිධ ආදායම් වර්ග CIGAS මෘදුකාංගය භාවිතයෙන් ගිණුම්ගත කිරීම වෙනුවට අතින් වාර්තා කර තිබීම හේතුවෙන් මුළු සත්‍ය ආදායම විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. | 2024 වසරේ සිට ක්රියාමාර්ග ගනු ලැබේ. | CIGAS මෘදුකාංග පද්ධතිය භාවිතයෙන් සියලුම ආදායම් වාර්තා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තු 04 කට අදාල වාණිජ අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරකම්වල රු.මිලියන 36.90 ක හිඟ ණය ශේෂයන් පියවා නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදීද පියවීමට කටයුතු කර නොතිබුණි. | 2024 වසරේ සිට ක්රියාමාර්ග ගනු ලැබේ. | වාණිජ අත්තිකාරම් කඩිනමින් පියවිය යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තු **08** කට අයත් ඉඩම් **81** ක්, වාහන **98** ක්, යතුරුපැදි **71** ක්, සේවක නිල නිවාස **66** ක්, කාර්යාල ගොඩනැගිලි **28** ක් සහ ජල ටැංකි **51** ක් වසර **05** ක සිට **10** ක් දක්වා කාලයක් තුළ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් නොතිබුණි. | මෙම වත්කම් තක්සේරු කිරීමට පියවර ගනු ලැබේ. | එම වත්කම් තක්සේරු කිරීමට පියවර ගත යුතුය. |

**1.5.4 ශීර්ෂය - 926 පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ අමාත්‍යාංශ සහ විවිධ දෙපාර්තමේන්තු සඳහා අභ්‍යන්තර විගණකවරුන් පත් කර තිබුණද, අභ්‍යන්තර විගණන වාර්තා සහ පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කරන ලද නිර්දේශ සහ අභ්‍යන්තර විගණන නිරීක්ෂණ මත පදනම්ව අවසන් වූ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අභ්‍යන්තර විගණන වාර්තා සහ ඒවා පිළිබඳ ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.5 ශීර්ෂය - 930 කෘෂිකර්ම අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේදී පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් කාබනික කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා රුපියල් මිලියන 17.67 ක ස්ථිතික ෂ්‍රෙඩර් යන්ත්‍ර 30 ක් මිල දී ගෙන තිබූ අතර ෂ්‍රෙඩර් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා රෝද හතරේ ට්‍රැක්ටර් නොමැති වීම හේතුවෙන් අපේක්ෂිත කාර්යය සඳහා භාවිත කර නොතිබුණු අතර වසර 02 ක් පුරා අක්‍රියව පැවතුණි. | මෙම වත්කම් වෙනත් ආයතන වෙත පැවරීමට කටයුතු කරන්ර ලැබේ. | උපයෝජනය සඳහා නිසි සැලසුමක් / ශක්‍යතා අධ්‍යයනයක් සමඟ අත්පත් කර ගැනීම සිදු කළ යුතුය. |

**1.5.6 ශීර්ෂය - 931 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.මිලියන 1.05 ක් වූ රොටෝවේටර් 02 ක් අපේක්ෂිත කාර්යයන් සඳහා යොදා නොගෙන ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ මාස 07 ක් පුරා අක්‍රියව තබා තිබුණි. | රියදුරෙකු නොමැතිකම නිසා නිෂ්ක්‍රීයව පවතී. | අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | කරදියනාරු හි පිහිටි සේවා පුහුණු ආයතනයේ බිම්මල් ඒ කකයට රු.999,649 ක් වටිනා යන්ත්‍රෝපකරණ සහ උපකරණ සපයා තිබුණි. කෙසේ වෙතත්, මෙම යන්ත්‍ර සූත්‍ර ඒ සඳහා භාවිත කර නොතිබූ අතර තාක්ෂණික දෝෂ හේතුවෙන් වසර 5කට වැඩි කාලයක් අක්‍රියව තිබුණි. | භාවිතා කිරීමට පියවර ගනිමින් සිටී. | අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවට සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා රාජකාරී ආවරණය කිරීමේ පදනම මත කෘෂිකර්ම උපදේශකවරයෙකු පත් කර 2023 ජූනි 05 සිට 2024 ජූනි 24 දක්වා කාලය තුළ රු.මිලියන 1.08ක වැටුප් ගෙවා ඇති අතර, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 03 දෙනෙකුට නිල සංචිත වාහනය සාමූහිකව භාවිතා නොකර දෛනිකව තනි තනිව භාවිතා කිරීමට අවසර දී තිබුණි. | පරීක්ෂණයක් පවත්වනු ලැබේ. | අනුමත සේවක සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්කිරීමට කටයුතු කළ යුතු අතර, වාහන පාලනයට කටයුතු කළ යුතුය. |

**1.5.7 ශීර්ෂය - 934 වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.මිලියන 2.33 ක ගිවිසුම්ගත කොන්ත්‍රාත්තු මිලකට පොතුවිල්හි ගොවි සංවිධානයකට ලබා දී තිබූ පොතුවිල්හි නාඋල යෝජනා ක්‍රමයේ කාණු පද්ධතියේ වැඩිදියුණු කිරීමේ කටයුතු, සමාලෝචිත වර්ෂය තුළ වැඩබිමට ප්‍රවේශ වීමේ ශක්‍යතා අධ්‍යයනයේ දුර්වලතා හේතුවෙන් අත්හැර දමා තිබුණි. | මෝසම් වර්ෂාව සහ වැඩබිමට පිවිසීමේ ගැටලුව හේතුවෙන්, වැඩ කටයුතු නතර කර ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව නියමිත කාල සීමාව තුළ වැඩ නිම කළ යුතුය. |

**1.5.8 ශීර්ෂය - 941 අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනෙකුත් දෙපාර්තමේන්තුවලට/පළාත් සභාවලට ස්ථාන මාරුවී ගිය/ පැමිණි නිලධාරීන්, විශ්‍රාමික නිලධාරීන්, මියගිය නිලධාරීන්, වැඩ තහනම් කළ නිලධාරීන් සහ තනතුරුවලින් ඉවත් වූ නිලධාරීන් ඇතුළුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලවලින් අයකරගත යුතු රු.මිලියන 15.39 ක හිඟ ණය ශේෂයන් වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාලය තුළ නිරවුල් කර නොතිබුණි. | එම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර ඇත. | හිඟ ණය ශේෂය අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා ගෙවන ලද දීමනාවලට අදාලව අයකරගත් රු. මිලියන 11.49 ක් මහා භාණ්ඩාගාරයට පියවීමකින් තොරව වසර 04 ක් පුරා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | ඉතිරිය මහා භාණ්ඩාගාරයට පියවීමට කටයුතු කරනු ලැබේ. | ඉතිරිය මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | වසර 02 ඉක්මවූ කලාප අධ්‍යාපන කාර්යාල 17 ක සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රු.මිලියන 13.08 ක ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල් සහ විවිධ තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක 571 ප්‍රකාරව ක්‍රියාමාර්ග නොගෙන පොදු තැන්පතු ගිණුම්වල රඳවා ගෙන තිබුණි. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ කලාප අධ්‍යාපන කාර්යාල 03 ක ක්‍රියාත්මක කර තිබූ රු.මිලියන 18.25 ක ගිවිසුම්ගත කොන්ත්‍රාත්තු මිලකට ප්‍රදානය කළ සංවර්ධන කටයුතු තුනක්, සමාලෝචිත වර්ෂය තුළ නිම කරන ලද වැඩ සඳහා රු.මිලියන 1.98 ක් ගෙවා අත්හැර දමා තිබුණි. කෙසේ වෙතත්, අතහැර දැමීමට හේතුව විගණනයේ දී අනාවරණය නොවීය. | අදහස් දක්වා නොමැත. | ශක්‍යතා අධ්‍යයනය සහ කොන්ත්‍රාත් ගිවිසුම අනුව වැඩ නිම කළ යුතුය. |
| (ඉ) | පෝෂණ වැඩසටහන, පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන වැඩ, පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති වැඩ සහ UNICEF හි ව්‍යාපෘති කටයුතු සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලැබුණු රු.මිලියන 96.97 ක මුදල, 2022 වර්ෂයේ හා සමාලෝචිත වසරේදී අපේක්ෂිත ව්‍යාපෘති කටයුතු සඳහා යොදා නොගෙන රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීමට සහ පොදු තැන්පතු ශේෂයන් පියවීමට භාවිතා කර තිබුණි. | අනාගතයේදී මෙවැනි අඩුපාඩු නැවත සිදු නොවීමට කටයුතු කරනු ලැබේ. | අපේක්ෂිත අරමුණ සඳහා අක්මුදල් භාවිතා කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 18.67 ක මුදලක් වැය කර ගුරුවරුන් සඳහා කාර්ය මණ්ඩල නිල නිවාස 19 ක් ප්‍රතිසංස්කරණය කර තිබුණද, අපේක්ෂිත කාර්යයන් සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රීයව තැබීමට ඉඩ දී තිබුණි. | එය නිවැරදි කරනු ලැබේ. | අපේක්ෂිත කාර්යය සඳහා නිල නිවාස භාවිතා කළ යුතුය |

**1.5.9 ශීර්ෂය - 951 සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් පැමිණීම සහ පිටවීම තහවුරු කර නොගෙන සෞඛ්‍ය අංශය විසින් නිවාඩු දින වැටුප් සහ අතිකාල සඳහා රු. මිලියන 2,280 ක් ගෙවා තිබුණි. | භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | මහඔය සහ දෙහිඅත්තකණ්ඩිය මූලික රෝහලේ හෙද නිලධාරින් සඳහා කුලියට ගත් නිල නිවාස සඳහා විදුලිය හා ජල ගාස්තු නිවැසියන් විසින් ගෙවිය යුතු වුවද, එම නිලධාරීන් සමඟ ඇති කර ගත් ගිවිසුමට පටහැනිව 2019 ජනවාරි සිට 2023 මාර්තු දක්වා කාලය සඳහා අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් එම විදුලිය හා ජල ගාස්තු සඳහා රු.මිලියන 4.39 ක මුදලක් ගෙවා තිබුණි. | නිල නිවාස කුලිය අයකරගෙන තිබේ. | එම නිලධාරීන්ගෙන් විදුලිය හා ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | 2019 වසරේ වාලච්චේන මූලික රෝහලේ රු. මිලියන 50.55 ක වටිනාකමකට දැඩි සත්කාර ඒකකයක් ඉදිකර තිබුණද, විශේෂඥ වෛද්‍යවරුන් සහ පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් මෙම ඒකකය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබූ අතර වසර 04 ක් පුරා අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු නොකර නිෂ්ක්‍රීයව පැවතුණි. | වෛද්‍ය නිලධාරීන් නොමැතිකම හේතුවෙන් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය. | දැඩි සත්කාර ඒකකය භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

**1.5.10 ශීර්ෂය - 961 මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.මිලියන 88.06 ක් වූ ලොරි 04 ක් සහ යන්ත්‍ර 18 ක් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යාලවල වාණිජ කටයුතු සඳහා යොදා නොගෙන වසර 02 සිට 05 දක්වා කාලයක් නිශ්ක්‍රීයව තබා තිබුණි. | අනාගතයේදී කුලී ගාස්තු වැඩි කරගැනීම සඳහා මෙම වාහන සහ යන්ත්‍ර කුලියට දීමට කටයුතු කරනු ලැබේ. | අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**2. ප්‍රඥප්ති ගිණුම්**

**(අ) සංචාරක කාර්යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාතේ සංචාරක ආකර්ශනීය ස්ථාන 48 ක් හඳුනාගෙන තිබුණද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 මාර්තු 18 වැනි දිනැති අංක 1985/73 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV(A) කොටස ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් 10 ක් ඉටු කිරීමට හෝ පසුගිය වසර 05 තුළ තමන්ගේම ආදායමක් උපයා ගැනීමට ක්‍රියා කර නොතිබුණි. එසේ වුවද 2019 වසරේ සිට 2023 දක්වා කාර්යාංශයේ විවිධ කටයුතු සඳහා රු.මිලියන 128.40 ක මුදලක් පළාත් අරමුදල් ගිණුමෙන් ගෙවා තිබුණි. | ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | එම ප්‍රධාන කර්තව්‍යයන් ඉටු කිරීමට සහ තමන්ගේම ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) නිවාස අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිවාස 129 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. මිලියන 22.96 ක මුදලක් වෙන් කර තිබුණද, නිවාස ප්‍රතිසංස්කරණය සඳහා නිවැසියන් 72 දෙනෙකුට රු.මිලියන 18.06 ක මුදලක් ගෙවා තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පහසුකම් ලබා නොදීම හේතුවෙන් නිවාස 57 ක් ප්‍රතිසංස්කරණය කර නොතිබුණි. | මූල්‍ය ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර නොමැත. | වැඩ වෙනුවෙන් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අයවැය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ ස්ථිර සහ කොන්ත්‍රාත් පදනම මත පත් කරන ලද නිලධාරීන් 33 දෙනෙකු සඳහා රු.මිලියන 13.23 ක පුද්ගලික පඩිනඩි ගෙවා තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයෙන් පරිබාහිරව නිලධාරීන් 24 දෙනකු කොන්ත්රාත් පදනම මත බඳවාගෙන තිබේ. | කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය |